// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2403/64 – 2024 සැප්තැම්බර් මස 28 වැනි සෙනසුරාදා – 2024.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

යොමු අංකය: IR/COM/03/2020/47.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.10.30 දිනැති හා අංක 2356/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. අගුණකොලපැලැස්ස, එරම්ණියාය, අංක 376/15 ඩී 06, ලිපිනයෙහි පදිංචි එච්. ඩී. මල්කාන්ති මහත්මිය 2. වැලිපැන්න, හොරවල, "තක්සලා" ලිපිනයෙහි පදිංචි ඩබ්.ටී.කේ. රේණුකා මිය සහ කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක. 500 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A65/2023 හා 2024.07.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අගෝස්තු මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව.**

01. එච්.ඩී. මල්කාන්ති මිය,
අංක. 376/15 ඩී 06,
එරමිණියාය, අගුණකොලපැලැස්ස.

ආරාවුල් අංකය: අංක ඒ/65/2023
*IR/COM/03/2020/47*

02. ඩබ්.ටී.කේ. රේණුකා මිය
" තක්සලා "
හොරවල, වැලිපැන්න,

පළමු පාර්ශ්වය

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක. 500,
ටී.බී.ජයා මාවත,
කොළඹ 10.

දෙවන පාර්ශ්වය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එම්.එම්.අයි.ආර්.ඒ. ජයතිලක වන මා පත්කොට මා වෙත යොමු කර ඇත.

මෙම කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ ලෙස කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත්කර ඇත්තේ පහත පරිදි වේ,

" එච්.ඩී. මල්කාන්ති මිය සහ ඩබ්.ටී.කේ. රේණුකා මිය යන සේවිකාවන් දෙදෙනාට 2001.11.15 වන දිනට ලිපිකරු III ශ්‍රේණියේ පත්වීම හිමිද යන්නත් හිමි නම් එය ලබා නොදීම හා ඩබ්.ටී.කේ. රේණුකා මිය හට ලිපිකරු III ශ්‍රේණියේ පත්වීම හිමි නම් එය ලබා නොදී කම්කරු පත්වීම් ලාබාදීම තුළින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ."

පළමු පාර්ශ්වයේ එච්.ඩී. මල්කාන්ති නැමැති අය දැනට දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, මෙම ආරාවුල සම්බන්ධයෙන් කටයුතු කරන අංශයේම පරිපාලන නිලධාරිනියක ලෙස සේවය කරන බැවින් ඇයට මෙම බේරුම්කරණයේ සාක්ෂි විභාගයට සහභාගි විය නොහැකි බවට 2023.11.25 වෙනි දිනැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව පළමු පාර්ශ්වයේ ඩබ්.ටී.කේ රේණුකා නැමැති අය පමණක් බේරුම්කරණය සඳහා ඉදිරිපත් වී සාක්ෂි විභාගයට පෙනී සිට ඇත. 2023.11.15 වන දින සිට 2024.02.20 වෙනි දින දක්වා සාක්ෂි විභාගය පැවැත් වූ අතර 2023.03.15 දිනට ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස දෙපාර්ශ්වයට නියම කළෙමි.

දෙපාර්ශ්වය වෙතින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශන, ඉදිරිපත් වී ඇති සාක්ෂි සම්පිණ්ඩන හා තොරතුරු සියල්ල විශ්ලේෂණය කරමින් සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලබාදීමට කටයුතු කළෙමි.

.

පළමු පාර්ශ්වයේ දෙවන ඉල්ලුම්කාරිය වන ඩබ්.ටී.කේ. රේණුකා නැමැති අය 1996.06.01 දින සිට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගනු ලැබූ බව දෙපාර්ශ්වය විසින්ම පිළිගනී. (දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පළමු විස්තර ප්‍රකාශයේ දෙවන ඡේදය හා දෙවන විස්තර ප්‍රකාශයේ පළමුවන ඡේදය)

ඩබ්.ටී.කේ. රේණුකා මියගේ සාක්ෂි මගින්ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඇය 1996.06.01 දින සිට කොන්ත්‍රාත් පදනම මත ලිපිකාරිනියක ලෙස සේවයේ යොදවන ලද බවට ප්‍රකාශ කර ඇත.

ප්‍ර : ඔබ මෙම දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මුලින්ම සේවයට බඳවාගත්තේ කවදාද?

පි : 1996.06.01

ප්‍ර : ඔබව එම අවස්ථාවේ යම් ස්ථානයකට සේවයට අනියුක්ත කළාද?

පි : ඔව්. මහවැලි අධිකාරිය සතු සම්පත් සංවර්ධන අංශයේ පූනානි සත්ව ගොවිපළට ස්වාමීනි,

ප්‍ර : පූනානි සත්ව ගොවිපළට ඔබ යොමු කළේ කුමන රාජකාරී ඉටු කිරීම සඳහාද ?

පි : කොන්ත්‍රාත් ලිපිකරු කියලා තමයි මට කීව්වේ.

පි : පත්වීම් ලිපියක් දුන්නේ නැද්ද?

පි : දුන්නා

ප්‍ර : එහි සඳහන් වෙන්නේ කෙසේද ?

පි : Contract Clerk කියලා

(2023.11.29 දින සාක්ෂි සටහන් පිටු අංක 2)

1997.04.30 වන දින ඇය මඩකළපුවේ පූනානි සත්ව ගොවිපළෙන් වැලිකන්ද මුතු වැල්ල සත්ව ගොවිපළට ස්ථානමාරුකර යවා ඇත. 1999.02.28 දින සිට නැවතත් ඇය කොන්ත්‍රාත් ලිපිකරු නිලධාරිනියක ලෙස ගිරාදුරුකොට්ටේ සත්ව ගොවිපළට ස්ථාන මාරුකර යවා ඇත.

මෙම ගොවිපළවල් පවත්වාගෙන ගොස් ඇත්තේ. මහවැලි අධිකාරි පනතින් ලබාදී ඇති ප්‍රතිපාදන අනුව පිහිටුවා ඇති පුද්ගලික සමාගමක් වන පශු සම්පත් කෘෂි පුද්ගලික සමාගම මගිනි. මෙම සමාගමේ වැඩි කොටස් ප්‍රමාණයක් මහවැලි අධිකාරියට අයත් වන අතර ඒ හේතුවෙන් පශු සම්පත් කෘෂි පුද්ගලික සමාගමට පත්කළ යුතු අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් අතුරින් වැඩි සංඛ්‍යාවක් මහවැලි අධිකාරිය මගින් පත්කර ඇත. ඒ අනුව මෙම පුද්ගලික සමාගම මෙහෙයවනු ලබන්නේ මහවැලි අධිකාරිය මගින් වන අතර පශු සම්පත් පුද්ගලික සමාගම විසින් ගනු ලබන සෑම තීරණයක් වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට වගවීමක් (Accountability) පැවරේ. එමෙන්ම පශු සම්පත් කෘෂි පුද්ගලික සමාගමට තමුන් විසින් ගනු ලබන තීරණ පිළිබඳ වගකීම (Responsibility) පැවරේ.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දෙමින් මහවැලි අධිකාරියේ පරිපාලන නිලධාරිනි විජේකෝන් මුදියන්සේලාගේ දීප්ති ඉමුජිනි යන අය කියා සිටියේ මෙම පුද්ගලික සමාගම යටතේ සේවය කරන ලද සේවකයින් ද මහවැලි අධිකාරිය යටතේ සේවය කරන ලද සේවකයින් වශයෙන් පිළිගන්නා බවයි.

ප්‍ර : හැබැයි ඔබතුමිය හරස් ප්‍රශ්නවලදී කියා සිටියා මහවැලි අධිකාරි පනත යටතේ පිහිටුවා තිබෙන සමාගමක් නිසා එහි සේවකයිනුත් මහවැලි අධිකාරියේ සේවකයින් වශයෙන් සලකනවා කියලා ?

පි : ඔව්

ප්‍ර : එතකොට එහෙම සේවකයින් මහවැලි අධිකාරියේ සේවකයින් ලෙස සැලකුවත් සේවකයින් බඳවා ගැනීමේ කටයුතු කරන්නේ ඒ පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය කියලා කිව්වොත් මම නිවැරදිද ?

පි : ඔව්

(2024.01.03 සාක්ෂි සටහන් පිටු අංක 13)

ප්‍ර : දැන් තමන්ට කොටස් වැඩි ප්‍රමාණයක් තිබෙනවා නම් අධ්‍යක්ෂක මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ අයිතියක් තිබෙනවා මහවැලි අධිකාරියට?

පි : ඔව්

(2024.01.03 සාක්ෂි සටහන් පිටු අංක 13)

1996.06.01 දින සිට 2001.11.15 වන දින දක්වා දිගටම මෙම නිලධාරිනිය සේවයේ යොදවා ඇත්තේ කොන්ත්‍රාත් පදනම් මත ලිපිකරු නිලධාරිනියක් ලෙසිනි.

ප්‍ර : මේ ගරු අධිකරණයට ඔබ කියන්නේ, ඔබට මුලින්ම කොන්ත්‍රාත් ලිපිකරුවෙකු වශයෙන් සේවයේ යොදවලා සේවය ලබා ගත්තා ඉන් අනතුරුව 2001.11.15 වන දින ලිපිය මගින් කම්කරු තනතුරේ පත්වීමක් දුන්නත් ලිපිකරුවෙකුගේ සේවාව තමයි ඔබෙන් ගත්තේ කියලා?

පි : ඔව්

ඉල්ලුම්කාරිය මුලික සාක්ෂි ලබා දෙමින් කියා සිටියේ තමන් දිගින් දිගටම් ස්ථිර ලිපිකරුවෙකුට අදාළ රාජකාරී ඉටු කරමින් කොන්ත්‍රාත් ලිපිකරු තනතුරේ සේවය කළ බවයි.

ප්‍ර: එතකොට ඔබ කොන්ත්‍රාත් ලිපිකරුවෙකු වශයෙන් ඔබ කළේ ස්ථිර ලිපිකරුවෙක් විසින් ඉටු කළ යුතු රාජකාරිද?

පි: ඔව් ස්වාමිනි, මම පඩි හැදීම කළා. ඒ හැර ගබඩාව සම්පූර්ණයෙන්ම වාගේ මම තමයි ස්වාමිනි කළේ. ඒ හැර ලියුම් ටයිප් කිරීම ආදී සියලු දේවල් කළා. ලිපිකරුවෝ සේරම සේවය හැර ගිහිල්ලා සිටියේ. මොකද 1996 කියන්නේ ත්‍රස්තවාදී කළබල සමය. ඉතින් එතන වැඩ කරන්න කෙනෙක් නැති නිසා දිගටම වැඩ කළා.

(2023.11.29 සාක්ෂි සටහන් පිටු අංක 01)

ඉල්ලුම්කාරියගේ සාක්ෂිවලට අමතරව ඒ බැව් ගිරාදුරු කෝට්ටේ සත්ව ගොවිපළේ සහකාර කළමනාකාරු විසින් මහවැලි අධිකාරියේ ලිපි ශීර්ෂයක් යටතේ ලබාදී ඇති 2012.12.28 දිනැති සේවා සහතිකයෙන් සනාථ වේ. එම සහතිකයේ අඩංගු කරුණු පිළිබඳව දෙවන පාර්ශ්වය හබ නොකරයි. එම සහතිකය පළමු පාර්ශ්වයේ පළමු විස්තර ප්‍රකාශය සමඟ සහ අවසාන ලිඛිත දේශනය සමඟ A5 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.

සාක්ෂි විභාගයේදී ඩබ්. ටී. රේණුකා යන අය විසින් අවධාරණයෙන් කියා සිටින්නේ, ආයතන සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 5.1 වන වගන්තියෙන් කියවෙන පරිදි තාවකාලික සේවිකාවක් ලෙස අවුරුදු 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තමන් ස්ථිර තත්වයට පත් කිරීමට තම සේවායෝජක ආයතනය වන දෙවන පාර්ශ්වය බැඳී ඇති බවයි. එසේ වීමට නම් දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් තම ආයතනයේ පරිපාලන කටයුතු වෙනුවෙන් ආයතන සංග්‍රහය අනුව කටයුතු කිරීමට තීරණය කර තිබිය යුතුය. 2013.08.28 දිනැති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති අධක්ෂක මණ්ඩල පත්‍රිකාවේ ආවරණ ලිපියේ (දෙවන පාර්ශ්වය විසින් R6 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛනය ) පළමු ඡේදය අනුව සේවක පරිපාලන කටයුතු වලදී ආයතන සංග්‍රහයේ ඇතැම් විධිවිධාන 2013 වසරට පෙර සිට අදාළ කර ගෙන ඇති බව තහවුරු වේ. ඒ අනුව ඉල්ලුම්කාරිය විසින් ආයතන සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 5.1 වගන්තිය අනුව තමන්ගේ රැකියාව ස්ථිර කළ යුතු බවට ඉල්ලීම් කරන බව පැහැදිලිය.

මෙම ඉල්ලීම ඉටු කිරීමට නම් ඉල්ලුම්කාරිය අවුරුදු 5ක අඛණ්ඩ සේවා කාලයක් තාවකාලික පදනම මත සේවය කර තිබිය යුතුය. නමුත් ඉල්ලුම්කාරිය සේවය කර ඇත්තේ කොන්ත්‍රාත් පදනම මත වූ සේවා කාලයකි. කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යෙදවීමෙන් අදහස් වනුයේ යම් ස්ථිර තනතුරක වූ පුරප්පාඩුවක් පුරවන තුරු යම් සේවකයෙකුගේ සේවය නිශ්චිත කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ ලබා ගැනීම වේ. එම නිශ්චිත කාලයෙන් පසුව එකී සේවකයාගේ සේවය අහෝසි වී යයි. මෙම සේවිකාව ද නිශ්චිත කාල පරාසයක් සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යොදවා ඇති අතර එක් කාල පරාසයක් අවසානයේ කොන්ත්‍රාත්තුව නැවත අලුත් කර නැවත සේවයේ යොදවා ඇත. මෙසේ නැවත නැවතත් කොන්ත්‍රාත්තුව අලුත් කරමින් දිගින් දිගටම මෙම සේවිකාව සේවයේ යොදවා ඇත. සාක්ෂි විභාගයේ A2 ලෙස ලකුණු කර පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලේඛනයෙන් ඒ බව තහවුරු වේ. මෙලෙස කොන්ත්‍රාත්තුව වරින් වර අලුත් කරමින් එක දිගට කොන්ත්‍රාත් පදනම මත ස්ථිර තනතුරක සේවයේ යෙදවීම නිසා ඇය සේවය කර ඇත්තේ සත්‍ය වශයෙන්ම කොන්ත්‍රාත් පදනම මත නොව අනියම් පදනම මත බව තහවුරු වේ.

" අනියම් පදනම මත සේවකයෙකු " යන්න ආයතන සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 2.2 වගන්තිය මගින් පහත පරිදි අර්ථ නිරූපනය කර ඇත. අනියම් නිලධාරියා යනු අනියම් තනතුරක් ලෙස අනුමත කොට ඇති තනතුරකට දවස් පඩි පිට කෙටි කාල සීමාවක් සඳහා අනියම් පදනම මත පත් කරනු ලැබ ඇති තැනැත්තෙකි. එසේ නැතහොත් තාවකාලික හෝ ස්ථිර තනතුරක් තාවකාලික පදනම පිට නැතහොත් ස්ථිර පදනම පිට පුරවන තෙක් අතුරු පූරක පියවරක් වශයෙන් පත්කරනු ලැබ ඇති තැනැත්තෙකි "

මෙම සේවිකාව කොන්ත්‍රාත් පදනම මත 1996.06.01 දින සිට 2006.06.01 දින දක්වා අනුයාත කාල පරාසයන් සඳහා ඒ ඒ කාල පරාසයක් ආරම්භයේ වරින් වර කොන්ත්‍රාත්තුව දීර්ඝ කරමින් සේවයේ යොදවා තිබීම නිසා ආයතන සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 2.2 වගන්තියට අනුව ඇය ස්ථිර තනතුරක පුරප්පාඩුව පුරවන තෙක් අතුරු පූරක පියවරක් ලෙස පත් කරන ලද සේවිකාවක් වශයෙන් නැතහොත් අනියම් සේවිකාවක් ලෙස හඳුනාගත හැකිය. නමුත් 4 වන පරිච්ඡේදයේ 4.3 වගන්තිය යටතේ අනියම් තත්වයේ සිට තාවකාලික තත්වය ලබා ගැනීමට අනියම් සේවකයෙකු ලෙස අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. ඒ අනුව අවුරුදු 5ක අනියම් සේවා කාලයක්, තාවකාලික තත්වය ලබාගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඇයට 2001.06.01 වන විට තාවකාලික තත්වය ලබා ගැනීමට නොහැකිය. එබැවින් 2001.06.01 වන විට අවුරුදු 5ක අනියම් සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණ ද 4 වන පරිච්ඡේදයේ 5.1 වගන්තියට අනුව තාවකාලික පදනම මත අවුරුදු 5ක සේවා කාලයක් නොමැතිවීම නිසා ඇයට ස්ථිර තත්වයක් ලබා ගැනීමට හිමිකමක් නැත. නමුත් මෙම ආරාවුලට පාදක වී ඇති මූලික කරුණ වනුයේ 2001.10.29 දිනැති අංක : 27/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් ස්ථිර කිරීමේදී පළමු පාර්ශ්වයේ දෙවන ඉල්ලුම්කාරිය වන ඩබ්. ටී. කේ. රේණුකා යන අය ලිපිකරු ශ්‍රේණියේ පිහිටුවා ස්ථිර තත්වය ලබා නොදීමයි.

ඉහත චක්‍රලේඛනයට අනුව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇත්නම් 2001.10.01 දින සිට එම සේවකයින් ස්ථිර කළ යුතුය.

i. 2001.10.01 දිනට දින 180 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

iii. අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය.

iv. බඳවාගන්නා අවස්ථාවේදී වයස අවුරුදු 45 ඉක්මවා නොතිබිය යුතුය.

(දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි විභාගයේදී 27/2001 චක්‍රලේඛය R2 ලෙස ලකුණු කර ඇත.)

2001.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය අනුව 2001.11.01 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් මගින් ඉහත චක්‍ර ලේඛයේ දක්වා ඇති අවශ්‍යතාවයන් පහත සඳහන් පරිදි තවදුරටත් පැහැදිලි කර ඇත. ( 2001.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ ලිපිය පළමු පාර්ශ්වය විසින් A1 (a) ලෙස ලකුණු කර ඇත.

i. තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම සහ දෛනික ගෙවීම් පදනම මත බඳවාගත් සේවකයින්ට දින 180 ක අවම අඛණ්ඩ සේවා කාලයක් තිබිය යුතුය.

ii. අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

iii. අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය. ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය සංස්ථා විසින් අදාළ අමාත්‍යවරුන්ගේ අනුමැතිය ඇතිව මෙම කාර්ය වෙනුවෙන් අවශ්‍ය සේවක සංඛ්‍යාව නිශ්චය කළ හැකිය.

iv. බඳවා ගන්නා අවස්ථාවේදී වයස අවුරුදු 45 ඉක්මවා නොතිබිය යුතුය.

මෙම කාර්මික ආරාවුලට පාදක වී ඇති කරුණ වන දෙවන පාර්ශ්වය විසින් ඉහත චක්‍රලේඛයට හා 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ක්‍රියා කරමින් ඉල්ලුම්කාරියගේ සේවය ස්ථිර නොකිරීම නිසා ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදු වී ඇද්ද යන්න විමසා බැලීම සඳහා පියවර ගතිමි. ඒ සඳහා පැවති සාක්ෂි විභාගයේදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයේ එකඟත්වයක් ඇති බව අනාවරණය විය.

1. 2001.10.01 දිනට දින 180 ක අඛණ්ඩ සේවා කාලයක් කොන්ත්‍රාත් පදනම මත ලිපිකරුවෙකු ලෙස ඉල්ලුම්කාරිය විසින් සම්පූර්ණ කර තිබීම.

2. බඳවා ගන්නා අවස්ථාවේදී වයස අවුරුදු 45 ඉක්මවා නොතිබිම.

නමුත් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයේ ස්ථාවරය සාක්ෂි විභාගයේදී ප්‍රකාශ කර ඇත.

1. අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් ඉල්ලුම්කාරිය විසින් සපුරා නැත.

2. අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 2001.10.01 දින වන විට තිබී නැත.

දෙවන පාර්ශ්වය වන මහවැලි අධිකාරියේ පරිපාලන නිලධාරි විජේකෝන් මුදියන්සේලාගේ දීප්ති ඉවුජින් විජේකෝන් යන අය සාක්ෂි දෙමින් මෙසේ කියා සිටී.

ප්‍ර : ඒ ලිපිකරු කියන තනතුරට බඳවා ගැනීමේ පටිපාටිය අනුව අදාළ සුදුසුකම් මොනවාද?

පි : අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් වැඩ 6ක් සමත්වෙලා තියෙන්න ඕනේ. සිංහල හා ගණිතයට සම්මාන සාමාර්ථ සහිතව සම්මාන 4ක් තිබිය යුතුයි.

( 2023.12.21 දින සාක්ෂි සටහන් පිටු අංක 10)

ප්‍ර : සමස්ථයක් ලෙස ගත්තහම අනුමත බඳවා ගැනීමේ පටිපාටිය යටතේ ලිපිකාර තනතුරට බඳවා ගැනීමේ සුදුසුකම් (ඇයට ) තිබෙනවාද?

පි : නැහැ.

(2023.12.21 සාක්ෂි සටහන් පිටු අංක 11)

ප්‍ර : මෙම 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි තුන්වන කොන්දේසිය කුමක්ද?

පි : අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය.

ප්‍ර : එම කාලවකවානුවේ එවකට පැවති සේවක පුරප්පාඩු ගැන දන්නවාද?

පි : දන්නේ නැහැ.

ප්‍ර : එම කාලවකවානුවේ කිසියම් හෝ පුද්ගලයින් සංඛ්‍යාවකට සේවය අවසන් කිරීමේ කොන්දේසි ලබාදීම ගැන අවබෝධයක් තිබෙනවාද?

පි : ඔව්. 1997 ස්වේච්ඡාවෙන් විශ්‍රාමයාමේ වන්දි ක්‍රමයක් තිබුණා. ඒ අනුව අවශ්‍යය සේවක සංඛ්‍යාව තියාගෙන අතිරික්තය ඉවත් කිරීමට කටයුතු කළා.

ප්‍ර : ඇයි ? ස්වේච්ඡාවෙන් වන්දි ගෙවා යැවීමේ ක්‍රමයක් හඳුන්වා දෙන්නේ ආයතනයක්?

පි : සේවක අතිරික්තයක් නිසා.

( 2023.12.21 සාක්ෂි සටහන් පිටු අංක 12 සහ 13 )

දෙවන පාර්ශ්වයේ ස්ථාවරය ලෙස ඉහත දක්වා ඇති කරුණු දෙකෙන් දෙවන කරුණ මගින් කියවෙනුයේ අදාළ අවස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු නොතිබූ බවයි. නමුත් 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඒ සඳහා විසඳුම් ලබාදී ඇත. එම විසඳුම වනුයේ යම් ව්‍යවස්ථාපිත ආයතනයක මෙම 27/2001 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සඳහා පුරප්පාඩු නොමැති නම් මෙම චක්‍රලේඛයේ කාර්ය සඳහා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සේවක සංඛ්‍යාව නිශ්චය කර ගැනීමට එම ආයතනයට හැකියාව ඇති බවයි.

මේ අනුව කටයුතු කිරීමට දෙවන පාර්ශ්වය විසින් කිසිදු පළදායි පියවරයක් ගෙන නොමැති අතර සාක්ෂි විභාගයේදී දිගින් දිගටම තර්ක කරනු ලැබුයේ සේවක පුරප්පාඩු නොතිබූ බව පෙන්වා දීමටය.

දෙවන පාර්ශ්වයේ ස්ථාවරය ලෙස ඉහත දක්වා ඇති කරුණු දෙකෙන් පළමු කරුණ වූ අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් තිබූ අතර ලිපිකරු III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අවශ්‍යය අධ්‍යාපන සුදුසුකම් ඉල්ලුම්කාරියට නොතිබුණේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාක්ෂි විභාගයේදී දැඩි අවධානයක් යොමු කළෙමි.

අනුමත බඳවා ගැනීමේ පටිපාටිය ලෙස 1990.04.06 වන දින මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියක් එදින සිට ක්‍රියාත්මක වී ඇති බව දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි විභාගයේදී කියා සිටී. 2011.08.21 වන දින කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද එම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වූ දිනය වන 2011.08.21 දින දක්වාම ක්‍රියාත්මක වී ඇත්තේ 1990.04.06 දින මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව ඉල්ලුම්කාරිය විසින් ඉහත 27/2001 චක්‍රලේඛය හා 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉල්ලා සිටින සේවා ස්ථිරත්වයට අදාළ තනතුර වූ ලිපිකරු III ශ්‍රේණිය තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් වනුයේ අ.පො.ස (සා.පෙ) විභාගයෙන් සිංහල හා ගණිතයට සම්මාන සාමාර්ථ සහිතව සම්මාන 4ක් සමඟ විෂයන් 6කින් සාමාර්ථය ලබා තිබීම වේ.

ඉල්ලුම්කාරිය අ. පො.ස (සා.පෙ) විභාගයෙන් ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සම්මාන සාමාර්ථ 3 ක් සහ විශිෂ්ඨ සාමාර්ථ 1ක් සමඟ විෂයන් 8ක් සමත් වී ඇති බව සාක්ෂි මගින් තහවුරු වේ. ඒ හැර අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් විෂයන් 4ක් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා ඇත. (2023.11.29 දින සාක්ෂි සටහන් පිටු අංක :7)

ගණිතය විෂය සඳහා සම්මාන සමාර්ථයක් නොමැති වීම නිසා ඇයට ඉහත 27/2001 චක්‍රලේඛය හා 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලිපිකරු III ශ්‍රේණියේ සේවා ස්ථිරත්වයක් ලබාදීමට හැකියාවක් නොමැති බව දෙවන පාර්ශ්වය විසින් දැඩිව කියා සිටී. ඒ අනුව ඇයට 2001.11.15 දින ලබා දී ඇත්තේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් ලෙස 8 වන ශ්‍රේණිය සමත්ව සිටීමේ සුදුසුකම අනුව ස්ථිර පදනම මත වූ කම්කරු තනතුරකි. එම පත්වීම 2001.11.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී ඇත. ඒ අනුව කම්කරු තනතුරට අදාළ රාජකාරි පවරා ඇති අතර ඊට අදාළ වැටුපක් ගෙවා ඇත. 2001.11.15 දින සිට 2003.03.06 වෙනි දින දක්වා ඉල්ලුම්කාරියට පවරා අත්තේ කම්කරු තනතුරට අදාළ රාජකාරි බවට ලේඛ නමය සාක්ෂි ඉදිරිපත් වී ඇති නමුත් ඉල්ලුම්කාරිය සාක්ෂි විභාගයේදී ප්‍රකාශ කරන ලද පරිදි එම කාලය තුල ලිපිකරු රාජකාරි කළ බවට කිසිදු ලේඛනමය සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

2003.03.06 දින සිට ප්‍රධාන කාර්යාලයේ පිරිස් පාලන අංශය වෙත ස්ථාන මාරු කර ඇති අතර එදින සිට ඇයට පවරා ඇත්තේ ලිපිකරු රාජකාරි බවට ඉදිරිපත් වී ඇති ලිඛිත හා වාචික සාක්ෂි මගින් තහවුරු වේ. නමුත් කම්කරු තනතුරට අදාළ වැටුප 2003.03.06 දිනෙන් පසුවද ඇයට ගෙවා ඇත. යතුරු ලේඛක විභාගයෙන් සමත් වීම නිසා 2006.07.03 දින සිට යතුරු ලේඛක යතුරු ලේඛක III ශ්‍රේණියේ තනතුරට ඉල්ලුම්කාරිය පත්වීමක් ලබා ඇත. යතුරු ලේඛක III ශ්‍රේණියට අදාළ වැටුප එදින සිට ලැබී ඇති නමුත් යතුරු ලේඛක III ශ්‍රේණිය පත්වීම ලැබීමෙන් පසුව ද ඇය ලිපිකරු රාජකාරි කටයුතු වලට යොදවා ඇත. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විධායක අධ්‍යක්ෂකගේ 2008.04.28 දිනැති ලිපිය මගින් ඉල්ලුම්කාරිය වෙත ලබා දී ඇති සේවා සහතිකයේ ඇය 2003.03.06 දින සිට ලිපිකරු රාජකාරි කටයුතුවල යොදවා ඇති බවත් එසේ නමුත් 2006.07.03 දින සිට යතුරු ලේඛක III ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති බවත් සඳහන් කර ඇත. මහවැලි අධිකාරියේ විධායක අධ්‍යක්ෂක ගේ එම ලිපිය A8 ලෙස පළමු පාර්ශ්වය විසිනුත් R4 ලෙස දෙවන පාර්ශ්වය විසිනුත් ලකුණු කර ඇත.

ඉල්ලුම්කාරිය විසින් මූලික සාක්ෂි ලබා දෙමින් ද ප්‍රකාශ කර සිටියේ ඇයට 2001.11.15 දින සිට කම්කරු පත්වීමක් ලබා දුන් බවත් එදින සිට 2006.07.03 වෙනි දින දක්වා කම්කරු වැටුපක් පමණක් ලබා දුන් බවත් ය.

ප්‍ර: මොකක්ද ඔබට සිදු වෙච්ච අසාධාරණය ?

පි: මම ලිපිකරු තනතුරේ දිගටම රාජකාරි කළත් මට 2001.11.15 වන දින සිට 2006.07.03 වන දින යතුරු ලේඛක වෙනකම් මම කම්කරු, මට පුදුම අසාධාරණයක්, වේදනාවක් තිබුණා. මට කම්කරු වැටුප දුන්නේ. මම දිගටම වැඩ කළේ ලිපිකරුවෙක් විදිහට.

(2023.11.29 දින සාක්ෂි සටහන් පිටු අංක 14)

පළමු පාර්ශ්වය විසින් කියා සිටිනුයේ 1990.04.06 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියට අනුව බොහෝ විට අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කර නැති බවය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම කිසියම් බඳවා ගැනීමකදී ඊට අදාළ බඳවා ගැනීමේ සුදුසුකම් තම අභිමතය පරිදි තීරණය කරමින් කටයුතු කිරීමේ පරිචයක් (පුරුද්දක් ලෙස ක්‍රියාත්මක කරන ක්‍රමවේදයක්) ක්‍රියාත්මක වූ බව පළමු පාර්ශ්වය විසින් සාක්ෂි සහිතව පෙන්වා දෙයි. 1990 බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් නොසළකා හරිමින් සහ එකී බඳවා ගැනීමේ පටිපාටියට කිසිදු අදාළවීමක් නොමැති වෙනත් කරුණු අදාළ කර ගනිමින් පත්වීම් සහ උසස් වීම්

ලබා දීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කර ඇති බව පළමු පාර්ශ්වය විසින් පෙන්වා දෙයි.

ඉදිරිපත් වී ඇති සාක්ෂි මගින් පෙනී යන්නේ 2000 වර්ෂයේ සිට මහවැලි අධිකාරියේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ලෙස භාවිතා කර ඇත්තේ අධ්‍යාපන සුදුසුකම් වශයෙන් ඒ ඒ අවස්ථාවේදී අදාළ තනතුරට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන සුදුසුකමක් සහිතව සේවා පළපුරුද්ද හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගන්නා වෙනත් යෝග්‍යතාවයක් තිබීමය. මෙම ක්‍රමය පරිචයක් ලෙස 2000 වසරේ සිට දිගින් දිගටම ක්‍රියාත්මක කර ඇති බව සාක්ෂි විභාගයේදී තහවුරු වී ඇත. ඒ අනුව පහත සඳහන් සේවකයන් බඳවා ගැනීමේදී හා උසස් කිරීමේදී ඉහත සඳහන් කරන ලද " අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුන්වා දී ඇති නව බඳවා ගැනීමේ පරිචය " අනුව කටයුතු කර ඇති බවට ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු ගෙන්වා ගෙන සාක්ෂි මෙහෙයවීමේදී කරුණු අනාවරණය විය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන නිලධාරී කොස්හින්න විතානගේ ශ්‍යාමා විතානගේ විසින් මහවැලි අධිකාරියේ සේවකයින් 6 දෙනෙකුගේ පුද්ගලික ලිපිගොනු ඉදිරිපත් කරමින් සාක්ෂි ලබා දුනි.

ප්‍ර : පළමු පාර්ශ්වය ඉදිරිපත් කර තිබෙනවා සේවකයින් 6 දෙනෙකුගේ නම් ඒ සේවකයින් 6 දෙනාට නිසි අධ්‍යාපන සුදුසුකම් නොමැතිව උසස්වීම් ලබා දුන්න බවට, පළමු සාක්ෂිකරුවන්ගෙන් ඒ සම්බන්ධයෙන් නිසියාකාරව පිළිතුරක් නොලැබීම නිසා තමයි නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වෙනුවෙන් සාක්ෂිකරුවෙක් කැඳවීමට තීරණය කළේ. ඒ අනුව කැඳවා ඇති එම ලිපිගොනු ඔබ විසින් ගෙනවිත් තිබෙනවාද?

පි : ඔව්.

(2024.01.31 දින සාක්ෂි සටහන් පිටුව -1)

ඉදිරිපත් කරන ලද එම පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කරමින් සාක්ෂිකාරියගෙන් ලබා ගත් සාක්ෂි අනුව පහත සඳහන් තොරතුරු අනාවරණය කර ගන්නා ලදි.

01. ඩබ්. ජී. සී. පුෂ්ප කුමාර මහතා 1997.09.29 දින සිට කොන්ත්‍රාත් පදනම යටතේ පාලන සහකාරවරයෙකු ලෙස සේවයට බඳවා ගෙන ඇත. 2000.01.28 දින සිට එම තනතුර ස්ථිර කර ඇත. මෙම තනතුරු පිළිවෙලින් ලිපිකරු iii, ලිපිකරු ii, ලිපිකරු i ශ්‍රේණිවලට අදාළ තනතුරුවල සේවය කළ යුතු සේවා කාලයන් සම්පූර්ණ කිරීමෙන් පසුව ලැබිය යුතු එම තනතුරු වලට වඩා ඉහළ තනතුරකි. ලිපිකරු iii තනතුර සඳහා අවම අධ්‍යාපන සුදුසුකම වනුයේ ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව සම්මාන සාමාර්ථ 4ක් සමග විෂයන් 6 කින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතු වීමය. නමුත් මොහු මෙම සුදුසුකම් සම්පූර්ණ කර නැත. එසේ තිබියදී පිළිවෙලින් ලිපිකරු iii, ii,i තනතුරුවලට ඉහළ තනතුරක් වූ පාලන සහකාර තනතුරට මොහු පත් කර ඇත. සාක්ෂි විභාගයේදී හෙළි වූයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පෞද්ගලිකව කරන ලද ඉල්ලීමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම තීරණය ගත් බවකි. (2024.01.31 දින සාක්ෂි සටහන් පිටු අංක 02,03)

02. කේ.ඩබ්.ජී අනුෂා හිමාලි ගුණතිලක යන අය කාන්තා ආරක්ෂක නියාමකවරියක් ලෙස මහවැලි අධිකාරියට බඳවා ගෙන 2000.06.17 දින සිට කාන්තා ආරක්ෂක නියාමක II ශ්‍රේණියේ ස්ථිර කර ඇත. 2000, 2001 වර්ෂ සඳහා දේශපාලන පලිගැනීම් පිළිබඳ සොයා බැලීමේ කමිටු නිර්දේශ මත ඇයට සුදුසුකම් හා සේවා පළපුරුද්ද මත යයි කියමින් ලිපිකරු iii ශ්‍රේණියේ තනතුර ලබා දීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව 2005.08.11 දිනැති ලිපිය මගින් ඇයව ලිපිකරු තනතුරට පත් කර ඇත. ඇය සතුව ඇති අවම අධ්‍යාපන සුදුසුකම වන්නේ අ.පො.ස (සා. පෙළ) විභාගයට පෙනී සිටීම පමණකි. නමුත් එම විභාගය සමත් නැත.

03. ජී. බී. අයිරාංගනී පෙරේරා යන අය 1988.12.06 වන දින සිට කාන්තා ආරක්ෂක නියාමකවරියක ලෙස සේවය කර ඇත. කාන්තා ආරක්ෂක නියාමක තනතුර අහෝසි කිරීමට ගන්නා ලද තීරණයක් හේතුවෙන් 2005.08.27 දින සිට ඇයගේ සුදුසුකම් හා සේවා පළපුරුද්ද සලකා බලා යයි කියා ඇය ලිපිකරු iii ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඇයගේ අධ්‍යාපන සුදුසුකම් වනුයේ ගණිතයට සාමාන්‍ය සාමාර්ථයක් පමණක් ලබමින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්වීම පමණි

සාක්ෂි විභාගයේදී අනාවණය වුයේ ඇය ආරක්ෂක නියාමක ලෙස සේවය කරන වකවානුවේ එම කාර්යාලයේ ලිපිකරු රාජකාරි කටයුතු කිරීමේ පළපුරුද්ද මත සහ ආරක්ෂක නියාමක ලෙස ලබා ගත් වැටුප, ලිපිකරු iii ශ්‍රේණියේ වැටුපට සමාන වන බැවින් මෙම තීරණය ගත් බවයි.

1990.04.06 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ගත් බඳවා ගැනීමේ පටිපාටිය ඉවත දමා මෙම අවස්ථාවේදී අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කර ඇත්තේ තමන් විසින් තීරණය කරනු ලැබූ සුදුසුකම් මත බඳවා ගැනීම් කිරීමටය. 1990 බඳවා ගැනීමේ

පටිපාටිය අනුව මෙම අන්තර්ග්‍රහණය කළේ නම් මැය අන්තර්ග්‍රහණය කළ යුතුව තිබුණේ ඇයගේ අධ්‍යාපන සුදුසුකම්වලට ගැලපෙන තනතුරකටය.

04. ජී. එස්. ටී. කේ. සිරිවර්ධන යන අය කාන්තා ආරක්ෂක නියාමකවරියක ලෙස 2000.01.18 වන දින සිට සේවයට බඳවා ගෙන ඇත. කාන්තා ආරක්ෂක නියාමක තනතුර අහෝසි කිරීමේ තීරණය අනුව මැය ද 2005.12.06 වෙනි දින සිට සුදුසුකම් හා සේවා පළපුරුද්ද මත යයි සලකා ලිපිකරු iii ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. අනතුරුව 2007.08.07 වෙනි දින සිට ලිපිකරු ii ශ්‍රේණියට උසස් කර ඇත. 1990 බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලිපිකරු iii ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අවම අධ්‍යාපන සුදුසුකම වූ ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව සම්මාන සාමාර්ථ 4ක් සමග විෂයයන් 6කින් අ.පො.ස (සා.පෙ) විභාගය සමත් විය යුතුය. නමුත් මෙම නිලධාරිණියට ආපො.ස (සා.පෙ) විභාගයෙන් ගණිතයට සම්මාන සාමාර්ථයක් නැත.

එසේ නම් ඇයද අන්තර්ග්‍රහණය කළ යුතුව තිබුණේ ලිපිකරු iii ශ්‍රේණියට නොව ඇය ලබා ඇති අධ්‍යාපන සුදුසුකමට ගැලපෙන තනතුරක් සඳහාය.

05. ඒ. එම්. අශෝකා දමයන්ති කුමාරි යන අය 1999.10.18 දින සිට පරිගනක දත්ත ක්‍රියාකරු තනතුරට පත්වීම් ලබා ඇත. දේශපාලන පලිගැනීම් කමිටු නිර්දේශ මත එදින සිටම ඇය තනතුරේ ස්ථිර කර ඇත. 2006 වසරේදී ඇගේ ඉල්ලීම මත ඇයගේ තනතුර පරිගණක දත්ත ක්‍රියාකරු තනතුරේ සිට ලිපිකරු iii ශ්‍රේණියේ තනතුරට ඇයව පත් කර ඇත. ඒ වන විට ඇයගේ අධ්‍යාපන සුදුසුකම ගණිතයට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වීම පමණි. 1990 බඳවා ගැනීමේ පටිපාටිය අනුව ඇයට ලිපිකරු iii ශ්‍රේණිය ලබා ගැනීමට අවශ්‍ය ගණිතයට සම්මාන සාමාර්ථයක් අ.පො.ස (සා.පෙ) විභාගයෙන් ලබා ගෙන නැත. නමුත් ඇය 2007 වර්ෂයේදී ගණිතයට සම්මාන සාමාර්ථයක් අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිට ලබා ගෙන ඇත. ඒ අනුව ඇයට 2006 වසරේදී ලිපිකරු iii ශ්‍රේණියේ පත්වීමක් ලබා දීම මගින් පෙනී යන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 බඳවා ගැනීමේ පටිපාටිය ඉවත දමා කටයුතු කරන බවකි.

06. තුෂිතා හර්ෂප්‍රිය හල්වල යන අයට 2001.11.15 දින කම්කරු තනතුරක් සඳහා ස්ථිර පත් වීමක් ලබා දී ඇත. එම පත්වීම ලබා දී ඇත්තේ අංකඃ 27/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය අනුව දින 180 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද අනියම්, ආදේශක, තාවකාලික, කොන්ත්‍රාත් පදනම සහ දෛනික වැටුප් ලබන සේවකයින් ස්ථිර කිරීමේ තීරණය පරිදිය. ස්ථිර කම්කරු තනතුරක පත්වීම ලැබීමට පෙර ඇය ලිපිකරු රාජකාරි කර ඇත. නමුත් දෙවන පාර්ශ්වය කියා සිටින්නේ ස්ථිර පදනම යටතේ ලිපිකරු iii ශ්‍රේණිය ලබාදීමට බඳවා ගැනීමේ පටිපාටිය අනුව අවම අධ්‍යාපන සුදුසුකම් ඇයට නැති බවකි. තමන්ට අසාධාරණයක් සිදු වී ඇති බවට ඇය විසින් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති අතර කම්කරු අමාත්‍යවරයා විසින් කාර්මික ආරාවුල් පනතේ 4.1 වගන්තිය යටතේ බේරුම්කරණය කිරීමට අංක ඒ/3440 යටතේ මෙම ආරාවුල යොමු කර ඇත. එම බේරුම්කරණ ප්‍රදානය අනුව මැය 2001.11.15 දින සිට ලිපිකරු iii ශ්‍රේණියේ ස්ථිර කරන ලෙස නියම කර ඇත.

(වගඋත්තරකාර පාර්ශ්වය විසින් R17 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනය සහ 2024.01.31 දිනැති සාක්ෂි සටහන් පිටු අංක : 4)

මේ අනුව ඉහත ලිපි ගොනු 6 පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ,

01. වර්ෂ 2000 සිට 2008 පමණ වන තුරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 1990.03.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම නොසලකා ඉවත දමා ඇති බවත්

02. බඳවා ගැනීමේදී හා උසස් කිරීමේදී අවම අධ්‍යාපන සුදුසුකමක් පිළිබඳව සලකා බලා නැති බවත්

03. බඳවා ගැනීමේදි හා උසස් කිරීමේදී සළකා බලා ඇත්තේ සේවා පළපුරුද්ද හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ ඒ අවස්ථාවට අනුව තමන් විසින් තීරණය කරනු ලබන වෙනත් යෝග්‍යතාවයන් පමණක් බවත්,

04. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත අනුගමනය කරන ලද නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම ප්‍රවර්ධනය කරමින් පවත්වා ගෙන යනු ලබන " නව බඳවා ගැනීමේ පරිචයක් " ලෙස තවදුරටත් හඳුන්වා දිය හැකි බවත්ය.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර ඩබ්.ටී.කේ රේණුකා යන අය සම්බන්ධයෙන්ද අංක 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවකට ක්‍රියාත්මක කරමින් සිටි නව බඳවා ගැනීමේ පරිචය අනුව කටයුතු කළ යුතුව තිබූ නමුත් එසේ කර නැත. නව බඳවා ගැනීමේ පරිචය අනුව ඉල්ලුම්කාරිය විසින් 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්ථිර කිරීමට අවශ්‍ය සියලු අවශ්‍යතා සපුරා ඇත.

01. කොන්ත්‍රාත් පදනම මත දින 180 කට වැඩියෙන් වූ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත.

02. අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු නමුත් 2001.11.15 වන විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් “ 1990 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ම අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය ” ඉවත දමා නව බඳවා ගැනීමේ පරිචයක් ප්‍රවර්ධනය කරමින් තිබී ඇත. එම නව බඳවා ගැනීමේ පරිචය අනුව සළකා බලනු ලබන සුදුසුකම් ඉල්ලුම්කාරිය විසින් සපුරා තිබී ඇත.

i. අවුරුදු 5කට වැඩි කාලයක් ලිපිකරු සේවයේ අඛණ්ඩව සේවය කිරීම නිසා වූ පළපුරුද්ද.

ii. අවම අධ්‍යාපන සුදුසුකම් නව බඳවා ගැනීමේ පරිචයේදී නොසලකනු ලබන නමුත් අ.පො.ස (සා.පෙළ) සමත් ව සිටීම හා අ.පො.ස (උ.පෙළ) විෂයන් 4කින් සමත් වී තිබීම.

iii. අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු නොතිබුණද 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සේවක සංඛ්‍යාව තීරණය කිරීමට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව දෙවන පාර්ශ්වයට හැකියාව තිබී ඇත.

iv. බඳවා ගන්නා අවස්ථාවේදී වයස අවුරුදු 45 නොඉක්මවා තිබීම.

ඉහත පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදීත් මහවැලි අධිකාරිය විසින් ඉල්ලුම්කාරියගේ සේවය ස්ථිර කිරීමේදී තමා සේවය කරමින් සිටි ලිපිකරු තනතුරේම ස්ථිර නොකර කම්කරු තනතුරක ස්ථිර කිරීම නිසා සිදුව ඇති අසාධාරණය පිළිබඳව ආයතන ප්‍රධානීන් වෙත ලිඛිතවත් වාචිකවත් අභියාචනා කර ඇත. එම අභියාචනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ඉල්ලුම්කාරිය ඇතුළු මෙවැනි අසාධාරණයක් සිදු වී ඇති සියළු සේවකයින්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා 2003.06.25 දින පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට මෙම සේවයකයින් කැඳවා ඇත. (පළමු පාර්ශ්වය විසින් ලකුණු කර ඉදිරිපත් කර ඇති A9 ලේඛනය)

නමුත් කිසිදු හේතුවක් නොදක්වා එදින සම්මුඛ පරීක්ෂණය පවත්වා නැත. මේ දක්වා එකී සේවක අභියාචනා වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නැත. එසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පෞද්ගලිකව තෝරාගත් අයවලුන්ගේ අභියාචනා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර ඇති අවස්ථා ද ඇත.

උදා: ටී.එම්. ජයන්ති නැමැති අය 2001.11.01 දිනට පෙර පරිගනක දත්ත ක්‍රියාකරන්නියක ලෙස සේවය කරමින් සිටි අතර ඇය දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණි. නමුත් ඇයගේ සේවය ස්ථිර කර ඇත්තේ කම්කරු තනතුරක පිහිටුවමිනි. අංක 27/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම ස්ථිර කිරීම කර ඇත. නමුත් ඇයගේ අභියාචනයට අනුව 2006.09.01 දින සිට පරිගණක දත්ත පිවිසුම් ක්‍රියාකරු ii ශ්‍රේණිය තනතුරෙහි පිහිටුවා ස්ථිර කර ඇත. ඉල්ලුම්කාර පාර්ශ්වයේ පළමු විස්තර ප්‍රකාශයේ 9 ඡේදය මගින් මෙම සිදුවීම අනාවරණය කර ඇත. ඇය වෙනුවෙන් සිදු වී ඇති වරද නිවැරදි කිරීමේ ක්‍රියාව සත්‍ය බව දෙවන පාර්ශ්වය විසින් තමන්ගේ දෙවන විස්තර ප්‍රකාශයෙන් පිළිගෙන ඇත.

ඉල්ලුම්කාරිය විසින් ඉල්ලා සිටින තනතුර වූ ලිපිකරු iii ශ්‍රේණිය 2001.11.15 දිනට නොලැබීම නිසා ඇයට සිදුව ඇති මූල්‍ය හානිය සම්බන්ධයෙන් දෙපාර්ශ්වය විසින් සාක්ෂිකරුවන් ඉදිරිපත් කරමින් සාක්ෂි ලබා දෙන ලදී.

කාර්මික ආරාවුල් පනත යටතේ පනවා ඇති නියෝග අංක 21(1)ට අනුව පළමු පාර්ශ්වය විසින් සාක්ෂි විභාගය ආරම්භ කිරීමට පෙර ඉදිරිපත් කරන ලද විස්තර ප්‍රකාශයට අමුණා ඉදිරිපත් කරනු ලැබූ X1 ලේඛනය මගින් ඉල්ලුම්කාරියට ලැබීමට නියමිතව තිබූ තනතුර නොලැබීම නිසා වැටුප් ගෙවීමේදී සිදුව ඇති මූල්‍යමය පාඩුව පිළිබඳ විස්තර ඉදිරිපත් කර ඇත.

X1 ලේඛනය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දෙන ලෙස දෙවන පාර්ශ්වය විසින් කරනු ලැබූ ඉල්ලීමට ඉඩ ලබා දුනිමි. දෙවන පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී දෙවන පාර්ශ්වය විසින් ද R18 හා R19 ලෙස ලකුණු කරන ලද ලේඛන 2ක් ඉදිරිපත් කර සිටී.

ඉහත ලේඛන ඉදිරිපත් කරමින් දෙපාර්ශ්වයේ සාක්ෂිකරුවන් විසින් ලබාදුන් සාක්ෂි අනුව ඉල්ලුම්කාරිය විසින් 2001.11.15 දින සිට 2023.12.31 දක්වා කාලය තුළ සත්‍ය වශයෙන්ම ලබා ගෙන තිබූ මුළු වැටුපට ආසන්න වශයෙන් සමාන වූ වැටුපක්, ඇය විසින් 2001.11.15 දින සිට පත් කරන ලෙස ඉල්ලා සිටින ලිපිකරු iii ශ්‍රේණිය තනතුර එදිනට ලැබුණේ නම් එම කාලය තුළ දී ලබා ගනු ඇති බව නිරීක්ෂණය වේ.

මහවැලි අධිකාරියේ ගිණුම් නිලධාරිණී එච්.කේ.ඩී. ප්‍රියංගනී යන ඇය සාක්ෂි දෙමින් මෙම තත්වය තම ආයතනයේ පවත්වා ගෙන යනු ලබන ලේඛන ඉදිරිපත් කරමින් පැහැදිලි කර දෙන ලදී.

ප්‍ර: R 18 ලේඛනයේ අවසානයේ එකතුව කීයද? (2001.11.15 දින සිට 2023.12.31 දක්වා ලබා ඇති වැටුප)

පි: රු. 5,061,762.44

ප්‍ර: ඉල්ලුම්කාරිය දැනට ඉල්ලා සිටිනවා රු. 4,973,462.50 ? (ලිපිකරු iii ශ්‍රේණිය ලැබුණේ නම් 2001.11.15 දින සිට 2023.11.15 දක්වා ලැබිය යුතු වැටුප)

පි: ඔව්

ප්‍ර: ඊට වඩා වැඩි ප්‍රමාණයක් ආයතනයෙන් ගෙවලා තියෙනවාද දැනටමත්?

පි: ගෙවලා තියෙනවා.

මෙම කාලය සඳහා ඉල්ලුම්කාරියට වැරදීමකින් වැඩිපුර මුදලක් මහවැලි අධිකාරිය මගින් වැටුප් ගෙවීමේදී ගෙවා ඇති නමුත් එම මුදල නැවත අය කර නොගැනීමට මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම අවස්ථාවේදී තීරණය කර තිබූ බව සාක්ෂිකාරිය විසින් පෙන්වා දෙන ලදී

**දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා පිළිබඳව සළකා බැලීම.**

කාර්මික ආරාවුල් පනත යටතේ පනවා ඇති අංක 21 (1) නියෝගය අනුව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පළමු විස්තර ප්‍රකාශයේ පළමු ඡේදය මගින් සහ සාක්ෂි විභාගයේදී මතු කරන ලද විරෝධතා වලින් දෙවන පාර්ශ්වය විසින් පහත සඳහන් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කර ඇත.

මෙම ආරවුලට අදාළ සිද්ධිය සිදුවී අවුරුදු 22 ක් ගත වන තුරු පළමු පාර්ශ්වය විසින් නිද්‍රාව සිට ඇති බැවින් පළමු පාර්ශ්වයට සාධාරණයක් පැතීමට කිසිදු නෛතික අයිතිවාසිකමක් නැති බැවින් මෙම බේරුම්කරණයෙන් සහනයක් ලබා ගැනීමටද අයිතියක් නොමැති බව දෙවන පාර්ශ්වය විසින් කියා සිටී.

මේ සම්බන්ධයෙන් බේරුම්කරුගේ ස්ථාවරය සහ තීරණය පහත දක්වමි.

01. කම්කරු අමාත්‍යවරයා විසින් බේරුම්කරු වෙත යොමු කරන ලද කාර්මික ආරාවුල සම්බන්ධයෙන් අදාළ ව්‍යවස්ථාපිත පටිපාටිය අනුගමනය කරමින් සහ සාධාරණ සහ යුක්ති සහගත ලෙස සාක්ෂි විභාග කර සාධාරණ හා යුක්ති සහගත වූ ප්‍රදානයක් ලබා දීම මිස එම කාර්මික ආරාවුල බේරුම්කරණය කිරීමට සුදුසුද නැද්ද යන්න තීරණය කිරීම බේරුම්කරුගේ වගකීම නොවෙනු ඇත.

02. ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ඉහත මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

**නිගමන**

01. 1990.04.06 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවක බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. නමුත් ඉදිරිපත් වූ සාක්ෂි අනුව 2000 වර්ෂයේ පමණ සිට 2008 පමණ වන තුරු සේවක බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය ආයතනය තුළ ක්‍රියාත්මක වී නැත. එම කාලය තුළ පැවති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය නොසලකා හැර ඉවත දමා ඇති බව නිරීක්ෂණය වේ. ඒ වෙනුවට නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිචයක් ඇති කර ගෙන එකී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිචය ප්‍රවර්ධනය කරමින් පැවති බවට තීරණය කරමි.

02. අංක 27/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහවැලි අධිකාරියේ සේවයේ යොදවා සිටි දින 180ක අවම අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ස්ථිර තත්වයේ නොවන සියළු සේවකයින් තමන් දරන තනතුරේ 2001.11.15 දින සිට ස්ථිර කිරීමට එම අධිකාරිය විසින් තීරණය කර ඇත.

03. 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වන ඩබ්.ටී.කේ. රේණුකා විසින් ද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණ නමුත් ඇය දරමින් සිට තනතුරේ ස්ථිර කිරීමට මහවැලි අධිකාරිය කටයුතු කර නැත. ඇයට ස්ථිර පදනම මත කම්කරු තනතුරක් පිරි නමා ඇත. එය ඉහත චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමක් නොවේ. චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමක් නම් කළ යුත්තේ එම ඉල්ලුම්කාරිය දරමින් සිටි තනතුරේ ස්ථිර කිරීමයි. එමගින් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදුව ඇත.

04. i. 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පළමු අවශ්‍යතාවය ඉල්ලුම්කාරිය විසින් සපුරා ඇත. එනම් ඇය කොන්ත්‍රාත් පදනම මත දින 180කට අධික අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත.

ii. එම අවස්ථාව (2001.11.15) වන විට මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කර ඇත්තේ 1990 බඳවා ගැනීමේ පටිපාටිය නොවේ. ඒ වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නව බඳවා ගැනීමේ පරිචයක් ප්‍රවර්ධනය කරමින් ක්‍රියාත්මක කර ඇත. එම නව බඳවා ගැනීමේ පරිචය අනුව ඉල්ලුම්කාරිය සේවය කරමින් සිටි ලිපිකරු තනතුරේ පහළම ශ්‍රේණිය වූ ලිපිකරු iii තනතුරෙහි ස්ථිර කිරීමට සුදුසුකම් ලබා ඇත.

iii. 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය ක්‍රියාත්මක කිරීමේදී සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු නොතිබුණද 2001.11.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන සේවක සංඛ්‍යාව තීරණය කළ හැකිව තිබී ඇත. ඒ අනුව ඉල්ලුම්කාරිය ලිපිකරු iii ශ්‍රේණියේ ස්ථිර කිරීමට සේවක පුරප්පාඩු නොතිබීම යන කාරණය අදාළ නොවනු ඇත. මහවැලි අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට කිසිදු උත්සහයක් දරා නැත.

iv. 2001.11.05 වන දින විට ඉල්ලුම්කාරියගේ වයස අවුරුදු 45 ඉක්මවා නොතිබීම නිසා 27/2001 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඉල්ලුම්කාරිය එදින සිට ලිපිකරු iii ශ්‍රේණියේ ස්ථිර කිරීමට හැකියාව තිබී ඇත.

05. 2001.11.15 දිනට ඉල්ලුම්කාරිය ලිපිකරු iii ශ්‍රේණියේ ස්ථිර කළේ නම් එතැන් සිට අවශ්‍ය සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ශ්‍රේණි උසස්වීම් වලට අදාළ වෙනත් සුදුසුකම් ද සම්පූර්ණ කිරීමෙන් පසුව ඉල්ලුම්කාරියට තමාට හිමි ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීමේ අයිතිය ඇයට ලබා දිය යුතුව ඇත.

06. ඉල්ලුම්කාරියට 2001.11.15 දින සිට ලිපිකරු iii ශ්‍රේණියේ සේවා ස්ථිරත්වයක් ලැබී අදාළ ශ්‍රේණි උසස්වීම් ලැබුවද 2001.11.15 දින සිට 2023.12.31 දක්වා වූ කාලය වෙනුවෙන් හිඟ වැටුප් ලැබීමට හිමිකමක් නැත. (ඉල්ලුම්කාරියට ලිපිකරු iii ශ්‍රේණියේ සේවා ස්ථිරත්වය නොලබා තිබියදීත් මහවැලි අධිකාරිය විසින් වැටුප් වශයෙන් වැඩි මුදලක් ගෙවා ඇති බව සාක්ෂි විභාග යේදී අනාවරණය වී ඇත.)

**ප්‍රදානය**

පළමු පාර්ශ්වයේ දෙවන ඉල්ලුම්කාරිය වන වික්‍රම තන්ත්‍රිගේ කුසුම් රේණුකා යන අය 2001.11.15 දින සිට ස්ථිර පදනම මත ලිපිකරු iii ශ්‍රේණියේ පිහිටු විය යුතුය. ඉන්පසු අදාළ අවස්ථාවන්හි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් අනුගමනය කරනු ලබන ශ්‍රේණි උසස් කිරීමේ පටිපාටිය අනුව ඉල්ලුම්කාරිය ලිපිකරු ii ශ්‍රේණියේ සහ ලිපිකරු i ශ්‍රේණියේ පිළිවෙලින් පිහිටුවා ශ්‍රේණි උසස්වීම් ලබා දීමේ තීරණය ගැනීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියා කළ යුතුය.

නමුත් 2001.11.15 දින සිට 2023.12.31 දින දක්වා වූ කාලය තුල ඉල්ලුම්කාරිය විසින් ලිපිකරු iii ශ්‍රේණියට පත්වීම් ලබා ගන්නේ නම් එසේ පත්වීම ලැබීමෙන් පසුව වුවද ඇයට ලැබිය යුතු මුළු වැටුපට වඩා වැඩි මුදලක් ඉල්ලුම්කාරිය විසින් දැනට ලබා ගෙන ඇති බවට තහවුරු වී ඇති බැවින් එම කාලය සඳහා හිඟ වැටුප් ගෙවීමකින් තොරව ඇය අදාළ සුදුසුකම් ලබා ඇත්නම් ඇයට එම උසස්වීම් ලබාදීමට දෙවන පාර්ශ්වය විසින් කටයුතු කළ යුතුය.

නමුත් 2024.01.01 දින සිට මේ දක්වා හිඟ වැටුප් වෙතොත් එම හිඟ වැටුප් ඉල්ලුම්කාරියට ගෙවීමටද දෙවන පාර්ශ්වය විසින් පියවර ගත යුතුය.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ත සහගත ප්‍රදානයක් බවට ද තීරණය කරමි.

මෙම ප්‍රදානය රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දිනයේ සිට ඉදිරියට වූ මාස දෙකක කාලය ඇතුළත ක්‍රියාත්මක කර අවසන් කිරීමට දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කටයුතු කළ යුතුය. මෙම ප්‍රදානය නියමිත දිනට පෙර ක්‍රියාත්මක කිරීමෙන් පසු මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත අදාළ සියලු ලේඛන ඉදිරිපත් කොට තහවුරු කළ යුතුය.

2024 ජූලි මස 17 වැනි දින දීය.

එම්.එම්.අයි.ආර්.ඒ. ජයතිලක,
බේරුම්කරු.

EOG 09-0204

---

මගේ අංකය: IR/COM/02/2021/34.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.01.07 දිනැති හා අංක 2313/69 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.12.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතර, හිත්තැටිය නැගෙනහිර, උස්වත්ත හි පදිංචි ජේ. බී. නිශාන්ත මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් 1. රත්මලාන, ගාලු පාර හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2. මාතර, පිඹුරන, කුමාරතුංග මාවත, නො. 395, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානය (දකුණ) අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A03/2023 හා 2024.07.12 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණ ශාඛාව**

*නඩු අංකය:* A/03/2023.
IR/COM/02/2021/34.

ජේ. බී. නිශාන්ත මයා,
උස්වත්ත මාවත,
හිත්තැටිය,
මාතර.

*පළමු පාර්ශ්වය*

එදිරිව

1. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ගාලු පාර, රත්මලාන.

2. ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානය, (දකුණ)
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
නො. 395,
කුමාරතුංග මාවත,
පඹුරන,
මාතර.

*දෙවන පාර්ශ්වය*

*ප්‍රදානය*

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.
ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉංජිනේරු සහකාරවරයෙකු ලෙස සේවය කරන (1941 අංක 27 දරන පඩිපාලක ආඥාපනත පළමු කොටසින් ආවරණය වන) ජේ. බී. නිශාන්ත මහතාට ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල නියැලීම වෙනුවෙන් අතිකාල සඳහා ගෙවීම් කිරීමේ දී සාප්පු හා කාර්යාල පනතට අනුව ගණනය කර ගෙවීම් කිරීම මගින් අසාධාරණක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ගණනය කළ යුතු ආකාරය හා හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳ වේ.

ඒ අනුව මෙම ආරවුල A/03/2023 දරන බේරුම්කරණ අංකය යටතේ බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා පහත සඳහන් දිනයන් යටතේ විභාගය සඳහා කැඳවීම් කර ඇත.

2023/01/24

2023/03/01

2023/03/27

2023/05/30

2024/06/11

2023/01/24 කැඳවීම් සිදු කළද එදින මූලික ප්‍රකාශ දෙපාර්ශ්වය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමථය සඳහා සාකච්ඡා කරමින් යොමුවට අදාළ කරුණු සම්බන්ධ ලේඛන වාර්තා සමඟ පළමු ප්‍රකාශ කාර්යාලයට ගොනු කිරීමට දැනුවත් කරන ලදී.

ඒ අනුව පළමු පාර්ශ්වය ලිඛිතව කරුණු ඉදිරිපත් කළ අතර දෙවන පාර්ශ්වය මෝසමක් මගින් ඔවුන්ගේ පළමු ප්‍රකාශය ඉදිරිපත් කරමින් මේ පැමිණිල්ල නිශ්ප්‍රභා කිරීමට මූලික විරෝධතා ඉදිරිපත් කරයි.

2023/03/01 කැඳවීම් දිනයේ දී පළමු පාර්ශ්වයේ වැඩබාරගත් දිනය පිළිබඳ ගැටළුවක් මතු වූ අතර එය නිවැරදි කර ගැනීමෙන් පසු ලේඛන වල මුල් පිටපත් සමග නැවත කැඳවීම 2023/03/27 දින සිදු කර ඇත.

2023/03/27 දින සමතයක් පිලිබඳ තීරණයකට එකඟ වී ඇති අතර ඒ අනුව සමථය පිළිබඳ අවසන්වරට දැනුම් දීමට මාස 02 ක කාලයක් දෙවන පාර්ශ්වය ඉල්ලා සිටි නිසා 2023/05/30 ට දින ලබා දුන් අතර මූලික විරෝධතාවය සඳහා තීන්දුව එදින ලබා දීමට තීරණය කරන ලද අතර එදිනට පෙර දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාවය සඳහා කරුණු දැක්වීමට ද පළමු පාර්ශ්වයට දැනුම් දෙන ලදී.

2023/04/28 පළමු පාර්ශ්වය මූලික විරෝධතාවය සඳහා කරුණු ගොනු කළ අතර 2023/05/24 දෙවන පාර්ශ්වය සමථ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. දෙවන පාර්ශ්වයේ සමථ යෝජනාව වූයේ,

පළමු පාර්ශ්වයට 2008/03/11 සිට 2019 ඔක්තෝබර් මාසය දක්වා හිඟ අතිකාල ලෙස රු.495557.96 ක් ගෙවීමට එකඟ බවත් එකී මුදල වාරික තුනකින් ගෙවීමට දෙවන පාර්ශ්වයට හැකි බවත් ය. එම සමථය පළමු පාර්ශ්වකරුට පමණක් පුද්ගලික විය යුතු අතර පූර්වාදර්ශයක් නොවිය යුතු බවට වැඩි දුරටත් කරුණු ඉදිරිපත් විය.

2023/05/30 දෙපාර්ශ්වය කැඳවූ අවස්ථාවේ පළමු පාර්ශ්වය එම යෝජනාවට එකඟ වූ අතර අදාළ ගෙවීම් වාරික 3 කින් එනම් 2023/06/25, 2023/07/25, 2023/08/25 යන දිනවල සිදු කර ඒ බව බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවට දැනුම් දීමට එ ලබා දුන් නියමය පරිදි දෙපාර්ශ්වයම ඒ බව කාර්යාලයට දැනුම් දී ඇත.

2024/06/11 දෙපාර්ශ්වයම බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවට ගෙන්වා වැඩි දුරටත් කරුණු සනාථ කරගත් අතර ඒ අනුව බේරුම්කරණය සමථයකට පත් කර අවසන් කරන ලදි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තිරණයත් බව සහතික කරමි.

**සිසිර ආනන්ද කෝදාගොඩ,**
බේරුම්කරු,

2024 ජූලි මස 12 වැනි දින දී ය.

EOG 09 - 0205